

# අවස්ථාවාදය හා මාක්ස්වාදය

**විජයසිරි තිලකුමාර**
බ්‍රිස්බේන්

*ප්‍රජාතන්ත්‍රවාදී චන්දයකට ඉඩ නොදෙන මිනීමරු කොටින් සමග අප සාකච්ඡා කලයුතුයයි කොන්ඩලීසා රයිස් ව්‍යාංගර්තයෙන් අපට බලකරන අතර, මහජන චංදයෙන් බලයට පත්වුන පලස්තීන හමාස් කණ්ඩායම සමග සාකච්ඡා නොකරන බව ජෝර්ජ් බුෂ් ලොවට කියයි.*

ලංකාවේ මාක්ස්වාදීන් මූලික වශයෙන් කොටස් දෙකකට බෙදිය හැකියයි මට සිතේ. විශේෂයෙන්ම විශ්ව විද්‍යාලවලට ඇතුල්වූ අලුත මාක්ස්වාදීන් ලෙස පෙනී සිටින තරුණ පෙල තුල මේ එකිනෙකට පරස්පර විරෝධී කණ්ඩායම් දෙක පැහැදිලිව දැකිය හැකියයි විශ්වාස කරමි. සාමාන්‍ය පාසල් දිවියේදී බොහෝවිට තම සමාජ තලයටම අයත් එකම සංයුතියකින් යුත් ලමයින් සමග අධ්‍යාපනය ලබන ශිෂ්‍යයාට, විශ්ව විද්‍යාලයට ඇතුල්වූ විගස වෙනත් සමාජ තලයන්ට අයිති වැඩි වරප්‍රසාද ලබන පංතියකට අයත් ශිෂ්‍ය ශිෂ්‍යාවන් සමගද එකට අධ්‍යාපනය ලැබීමට සිදුවේ. මෙම විවිධ තලයන්ට අයිති ශිෂ්‍ය ශිෂ්‍යාවෝ එකට ගැටීමේදී පිලිඹිමු වන කිසියම් සමාජ අසාධාරණයක් දකින තරුණ මනස නිතැතින්ම මාක්ස්වාදීන් දෙසන සමාජ අසාධාරණය වනසා දැමීමේ ක්‍රියාවලිය දෙසට ඇදේ. මෙයින් ඉතා සීමිත කොටසක්, මාක්ස්වාදය දර්ශණයක් වශයෙන් හදාරා මාක්ස්වාදීන් වන අතර ඉතිරිය තම යටි සිතේ ඉපදුන, වරප්‍රසාද ලබන පංතිය කෙරෙහි ඇති ඉරීසියාව නිසා මාක්ස්වාදීන් බවට පෙරලේ. මාක්ස්වාදය දර්ශණයක් වශයෙන් හදාරා එය පිලිගන්නා කොටස උස් පහත් බේදයකින් තොරව සෑම සමාජ තලයකම සංකලණයක් වන අතර, ඉරීසියාව නිසා මාක්ස්වාදීන් වන්නන් තුල ඔවුන් දැනුවත්ව හෝ නොදැනුවත්ව පිලිසිඳ ගන්නා අභිමතාර්ථය වන්නේ කෙසේ හෝ ඉහත කී වරප්‍රසාද ලබන පංතියට ඇතුලු වීමය. තමන් සහ තම දෙමව්පියන් භාජනය වූ සමාජ අසාධාරණයට ඇති කෙටි කාලීන විසඳුම වන්නේ වරප්‍රසාද ලබන පංතියට ඇතුලත් වීම විනා මුලු සමාජ සංස්ථාවටම පොදු විසඳුමක් නොවන්නේය යන්න මොවුන්ගේ මූලිකම අදහස වන්නේය. මෙම ඉරීසියාව මත බිහිවූ ඊනියා මාක්ස්වාදීන්ගේ දර්ශණය මාක්ස්වාදී දර්ශණය නොව ඇත්ත වශයෙන්ම ආත්මාර්ථකාමීත්වයයි. ලංකාවේ මෙම ඊනියා මාක්ස්වාදීන් කෙතරම් ප්‍රමාණයක් ඇත්දැයි, මාක්ස්වාදයෙන් පටන් ගෙන එක්සත් ජාතික පක්ෂයේ නායක තනතුරු දක්වා ගමන් කර ඇති පිරිස දෙස බැලීමෙන් තේරුම් ගත හැකි යයි සිතමි.

මෙම ඊනියා මාක්ස්වාදීන්ගෙන් සමහරෙක් දේශපාලනයට ක්‍රියාත්මකව සම්බන්ධ නොවූවද, ලොකු තනතුරක් ලැබීමෙන් හෝ ලොකු දෑවැද්දක් සමග විවාහ වීමෙන් පසු, තමනුත් දැන් වරප්‍රසාද ලබන පංතියට අයත් යයි හැඟෙන අයුරින් හැසිරීමට වලිකන අතර තමන් ඉරිසියා කල පන්තියේ සිරිත් විරිත් අනුගමනය කරනුද දැකිය හැක. විශේෂයෙන්ම, යටත් විජිත සමයෙන් අපට උරුම වූ හීන මාණය පිලිබිඹු කරණ සිංහලයන් අතරදී ඉංග්‍රීසියෙන් කථා කිරීම වැනි සිරිත් තම මහත් තත්වය විදහා දක්වන දර්ශකයක් ලෙස යොදාගනී. මෙහිදී වඩාත්ම උපහාසාත්මක කරුන නම්, මොවුන් , පංති බේදයකින් තොරව හැම කෙනෙකුගේම පොදු භාෂාව වූ ඉංග්‍රීසිය කථා කරන ඔස්ටේලියාව වැනි රටවලදීත් මෙම සිරිත ප්‍රදර්ශණය කිරීමය. මොවුන් ගේ නිදසුනු මා නොකීවාට පංසලකට ගියවිට ඔස්ටේලියාවේ සිටින ඔබට දැකගත හැක.

මෙහිදී, නැගෙනහිර යුරෝපීය, එදා සමාජවාදී කඳවුරේ විශ්ව විද්‍යාල වල සිටි මාක්ස්වාදීන් ගැනද වචනයක් නොකීයේ නම් මෙම ලිපිය අංගසම්පූර්ණ නොවේයයි සිතේ. ලංකාවේ මෙන් නොව මෙම විශ්ව විද්‍යාල තුල මාක්ස්වාදීන් මෙන් පෙනී සිටීම, වැඩි වරප්‍රසාද ලබාගැනීමේ මාර්ගයක් වූ බැවින් හැම අවස්ථාවාදියෙක්ම මාක්ස්වාදියෙක් ලෙස කැපී පෙනීමට තැත්කල අතර අනිවාර්ය විෂයක් වූ දර්ශණවාදය උගන්නා අතරම ඊනියා සමාජවාදී රටවල තත් කාලීන පාලන ක්‍රමයත් තමා උගත් දර්ශණවාදයත් අතර තිබූ පරස්පරය විවේචනය කිරීමට අවශ්‍යවූ දිරියෙන් හෝ දැනුමින් හීනවූයේ යයි සිතේ. එම විවේචනයට අවශ්‍යවූ දිරිය තිබූ රෝහණ විජේවීර වැන්නන්ට උරුම වූ ඉරණම දන්නා මෙම විශ්ව විද්‍යාල වල සිටි මාක්ස්වාදීන් ලෙස පෙනී සිටි අවස්ථාවාදීන් එම විශ්ව විද්‍යාලවල පාලක පන්තියේ ඔත්තු කරුවන් බවට පත්වීය. මෙයින් කෝපයට පත් රෝහණ විජේවීර ගත් මඟ නිවැරදිදැයි විමසීම වෙනත් කරුණක් වන අතර එය මෙම ලිපියේ මාතෘකාවෙන් පරිබාහිර වන අතර විවාදයට තුඩු දෙන්නක්ද වේ. අදත් සමාජ අසාධාරණය ගැන ලියන ඔරුවල බන්දුට ද මෙම ඔත්තු කරුවන් විසින් රෝහණ විජේවීරට සමානවූ ඉරණමක් අත්කර දෙන ලදී. එහෙත් ඔරුවල බන්දු, රෝහණ විජේවීර තරම් දැඩි පියවරක් නොගත් අතර, සෝවියට් සිරමැදිරියක සිට යන කෘතිය ලිවීමෙන් සෑහීමට පත්විය. මෙහිදී වඩා වැදගත් වනුයේ, එදා මාක්ස්වාදීන් මෙන් පෙනීසිටි, සමාජවාදයේ නාමයෙන් පැසිස්ට් පාලනයක් ගෙනගිය රටවල අධ්‍යාපණය ලබාගත් අවස්ථාවාදීන් අද සිටින්නේ කුමන ස්ථාවරයකද යන්නයි. මොවුන්ගෙන් සමහරෙක් කටුණායකට ලඟාවූ මොහොතේම ලාංකීය විප්ලවය ක්‍රියාත්මක කරන්නට මෙන් උදම් වැනූ අතර, ලංකාවට පැමිණි පසු තම අවස්ථාවාදයේ උච්චම අවස්ථාවට පැමිනෙමින්, එදා ලංකාවේ තිබූ අවිචාර සමයට අයත් මිනීමරු දෙශපාලන නායකත්වය යටතේ ඉහල තනතුරු ලැබ එම දෙශපාලන ක්‍රියාදාමයේ පන්දම්කරුවන් බවට පත්විය. තවත් සමහරු යූඑන්පී දෙශපාලකයන්ට නෑකම් කියමින් චන්ද ව්‍යාපාරයේද යෙදමින් හෝ ඒ සඳහා තතනමින් සිටී. මොවුන් ඊනියා සමාජවාදී රටවල අධ්‍යාපණය ලද බව සැඟවීමට තැත් කරනුද පෙනේ.

මෙහිදී, එදා තිබු, ඊනියා සමාජවාදී කඳවුරේ බිඳ වැටීම මාක්ස්වාදයේ අවසානය යයි දක්වමින්, මාක්ස්වාදය වනාහී මියගොස් හෝ මිය ඇදෙමින් පවතින දර්ශණයක් යයි පවසා තමන් දැන් ඉන්නා ස්ථාවරය සාධාරණීකරනය කිරීමට තැත් කරන අවස්ථාවාදීන්ට වචනයක් කිවයුතුය. කුමන හේතුවක් මත සිදුවුනද, ඊනියා සමාජවාදී කඳවුරේ බිඳ වැටීමේ ආසන්නම ප්‍රතිඵලය නම් මෙලොව වැසි සියල්ලෝ ඇමෙරිකානු රජයට අවශ්‍ය අයුරු ජීවත්විය යුතුය යන්නය. ප්‍රජාත්‍රන්තවාදී චන්දයකට ඉඩ නොදෙන මිනීමරු කොටින් සමග අප සාකච්ඡා කලයුතුයයි කොන්ඩලීසා රයිස් ව්‍යාංගර්තයෙන් අපට බලකරන අතර, මහජන චංදයෙන් බලයට පත්වුන පලස්තීන හමාස් කණ්ඩායම සමග සාකච්ඡා නොකරන බව ජෝර්ජ් බුෂ් ලොවට කියයි. ඇමෙරිකානු ගැති පකිස්ථානයේ සහ වෙනත් රටවල හැම ඒකාධිපතියකුම ආරක්ෂාකරන ඇමෙරිකාව අවශේෂ රටවල ප්‍රජාත්‍රන්තවාදයක් ගැන කථා කිරීම විහිලුවකට වඩා තුන්වන ලෝකයේ මිනිසුන්ගේ බුද්ධියට කරන අපහාසයකි. මැදපෙරදිග රටවලින් ඊශ්‍රයාලයට පසුව වැඩිම ඇමෙරිකානු ආධාර ලබන රට ඊජිප්තුව වන අතර, පසු ගිය වසර විසි හතර තිස්සේ එරට පාලනය කරන්නේ ඒකාධිපති නායක හොස්නි මුබාරක්ය. ප්‍රජාතන්ත්‍රවාදය කෙසේ වෙතත්, තවමත් වරදකරුවන්ගේ අතපය සහ බෙල්ල ප්‍රසිද්ධියේ සිඳලන සවුදි අරාබියේ ඒකාධිකාරී පාලක රජ පවුලේ හොඳම මිතුරා ඇමෙරිකාව ය.

ඇමෙරිකානු ප්‍රතිපත්ති ගැන වටහා ගැනීමට, මයිකල් මුවර් ගේ නයින් ඉලෙවන් චිත්‍රපටිය නැරඹීම හෝ ඔහුගේ "Stupid white men" කෘතීය කියවීම ප්‍රමාණවත් යැයි සිතේ. වර්ෂයේ වැඩිම අලෙවියක් ලැබූ පොත් අතරින් ප්‍රථම ස්ථානය දිනූ මෙම කෘතියෙහි, ලෝකයේ දුප්පත්ම රටවල් හැටේ ජනතාවගේ සම්පත් වල මුලු වටිනාකම පොහොසත්ම ඇමෙරිකානුවන් තිදෙනාගේ සම්පත් වල එකතුවට වඩා අඩු බව මයිකල් මුවර් සඳහන් කරයි. මේ උදාහරණය පමණක් නූතන ධනවාදයේ අසාධාරණයේ තරම පෙන්නුම් කිරීමට සෑහේ යයි සිතේ. ඇමෙරිකානු, කැනේඩියානු සහ එක්සත් ජනපදය යන රටවල් තුනේම නාවික හමුදාවල සේවය කල එම රටවල් තුනෙන්ම උපාධි ලත්, මැද පෙරදිග ඉතිහාසය සහ යුද්ධ කටයුතු පිලිබඳ පශ්චාත් උපාධිධාරී , කැනේඩියානු ජාතික වේන් ඩයර් Gwynne Dyer ගේ අලුත්ම කෘතිය වන "Future Tense - The Coming World Order" යන කෘතිය ද ඇමෙරිකානු දෙශපාලන හා ආර්ථික ප්‍රතිපත්ති වල ඇති අසාධරණත්වය මනාව පැහැදිලි කරයි. ලඟදී ABC රේඩියෝව සමග තම කෘතිය ගැන වේන් ඩයර් කල සම්මුඛ සාකච්චාවකදී කියා සිටියේ ඇමෙරිකාව ඉරාකය ආක්‍රමණය කලේ න්‍යෂ්ටික අවි සහ ත්‍රස්ථවාදී තර්ජන පරාජයකිරීමට හෝ ප්‍රජාතන්ත්‍රවාදය පිහිටවීමට නොව අන්තර් ජාතික ව්‍යාපාරිකයන් අතලොස්සක ගේ අවශ්‍යතාවය මත බවයි. මෙම කෘතීන් කියවන්නෙකුට ඇමෙරිකානු දෙශපාලන ප්‍රතිපත්ති මෙහෙයවන්නේ සාමාන්‍ය ඇමෙරිකානු ජනතාව නොව අන්තර් ජාතික ව්‍යාපාරිකයන් අතලොස්සක් බව වැටහෙනු ඇත.

ඇමෙරිකානු දේශපාලන ප්‍රතිපත්ති මෙන්ම අපට පරිපූර්ණ විවෘත ආර්ථිකයක් පිහිටුවන ලෙස බණ දෙසමින්, ඇමෙරිකානු ගොවීන් ගේ ආරක්ෂාව උදෙසා විදේශීය අපණායනයන්ට සම්බාධක පනවන ඇමෙරිකානු ආර්ථික ප්‍රතිපත්තීන් දෙසත් බලන කල, ධනවාදයත්, එය පෙරටු කරගත් විවෘත ආර්ථිකයත්, ප්‍රාථමික සමාජයේ සිට පරිණාමය වෙමින් පැවත එන සමාජ සහ අර්ථ ක්‍රමවල අවසානය යයි පිලිගත හැකිද. ඊලඟ සමාජ සහ අර්ථ ක්‍රමය කුමක්දැයි මම නොදනිමි. එහෙත් නූතන ධනවාදය, සමාජ සහ අර්ථ ක්‍රම පරිණාමයේ එක් අඩියරක් වුවද එහි අවසානය විය නොහැකි ය.

මෙම කරුණු සලකා බලා පවතින ඔනෑම ක්‍රමයකට මුක්කු ගසන, තමාට වාසි අවස්ථාවේදී මාක්ස්වාදීන් මෙන් පෙනී සිට පසුව තම වෙස් මුහුණු මාරු කරගන්නා අවස්ථාවාදීන් ගෙන් එක ඉල්ලීමක් කල හැකියයි සිතමි, එනම් මුලු ලොවම රැ වටිය හැකිමුත් තම හර්ද සාක්ෂිය රැ වටිය නොහැකි බැවින්, මිය යන්නට පෙර සවයං විවේචනයක යෙදෙන ලෙසයි. මුලු ලොවම ඉදිරියේ සවයං විවේචනයේ යෙදීමට දිරිය නැතිනම්, තම බිරිඳ හා දරුවන් ඉදිරියේවත් එසේ කලහොත් සැනසිල්ලේ මියයාමටත් අවංක මිනිසුන්ගේ සාපයෙන් මිදීමටත් එය උපකාරීවිය හැකි ය.

■

19 පිටෙන්

උපදෙස් වලට අනුව පිරිමියෙකු සතියේ වැඩි දින ප්‍රමාණයක් මධ්‍යම ප්‍රමාණයේ ව්‍යයොම් වල විනාඩි 30 ක් වත් නිරත විය යුතු බව දක්වා තිබෙනවා.

**ඔබේ සැමියාගේ මානසික සුවය පිළිබඳව ඔබ දැනගත යුතු කරුණු මොනවාද?**
සංඛ්‍යා ලේඛණ වලට අනුව පිරිමින් 6 දෙනෙකුගෙන් එක් අයෙකු කිසියම් හෝ මානසික අවපීඩනයකින් ːැචරැිසදබ* පෙළෙන බව සොයාගෙන තිබෙනවා. තම සහකාරියගෙන් දුරස්වීම, සහකාරිය මියයාම, දික්කසාදවීම හෝ අත්හැරදැමීමට ලක්වීම යන හේතු නිසා පිරිමින් මානසික පීඩනයට ලක්වෙනවා. එම තත්වයට පත්වූවකු මත්ද්‍රව්‍ය මත්පැන් වලට ඇබ්බැහිවීම පමණක් නොව දියවැඩියාව සහ හෘද රෝග වලට ගොදුරු වීමට පවා එව හේතු වන බව සොයාගෙන තිබෙනවා. එපමණක් නොව එම ත්තවයට පත්වූවකු දැඩි විනාශකාරී ක්‍රියාවන්ට පවා පෙළඹිය හැකි ය. එවැනි සිදුවීම් අප සමාජයේ අසන්නට ලැබෙනවා. මානසික පීඩනයේ ප්‍රධාන ලක්ෂණ වන්නේ

1 දවසේ වැඩි වේලාවක් කළකිරුණු සහගත ස්වභාවයෙන් පසුවීම
2 කිසි දෙයක් ගැන උනන්දුවක් නොමැති ස්වභාවය හෝ සතුටක් නොමැති වීම
3 ආහාර රුචිය අසීමිත ලෙස වැඩිවීම හෝ අඩුවීම
4 සිරුරේ බර වැඩිවීම හෝ අඩුවීම
5 නින්ද නොයාම හෝ දැඩි ලෙස නිදාගැනීම
6 නොසන්සුන් බව හෝ මන්ගාමී බව
7 අධික විඩාව හෝ ශනක්තිය අඩුවීම
8 තමන් කිසි අගයක් නැති පුද්ගලයෙකු බවට ඇති හැඟීම
9 තමන් වැරදි කරුවකු බව සිතීම
10 යමකට සිත යොමුකිරීමට අපහසු වීම
11 මරණය හෝ සිය දිවි නසාගැනීම පිළිබඳව සිතීම

ඔහුගේ හැසිරීම් රටාවේ මෙබඳු යම් වෙනසක් ඔබ නිරීක්ෂණය කරන්නේ නම් ඔහු සුදුසු වෛද්‍ය වරයකු වෙත යොමු කිරීමත් ඔබ සතු වගකීමක්.

■